37 වන පිටෙන්

මීටර් 10 පමණ දුරකින් පිහිටා ඇති නිසා ලඟවීමත් පහසුය.

වලපනේ කේන්ද්‍රකොට බොහෝ ආකර්ෂණීය ස්ථාන පිහිටා ඇති බව කඳුකරයේ සිතියමක් දෙස විමසිල්ලෙන් බලන ඔබට පෙනේවි. මෙහි සිට පැය එකහමාරක් පමණ දකුණු දිශාවට ගමන් කරන විට බදුල්ල දිස්ත්‍රික්කයේ දුන්හිඳ දිය ඇල්ල පිහිටි ප්‍රදේශයට ගමන් කළ හැකිය. එසේම වලපනේ සිට උතුරු දිශාවට ගමන් කරන විට පැයකට අඩු කාලයකින් නුවරඑළියට ළඟා විය හැකියි. මෙහි සිට නිරිත දිශාවට යනවිට මහියංගනයට අපේ ආදිවාසීන් වෙසෙන දඹානට යාමට ගතවන්නේ පැය භාගයක් වැනි කාලයකි.

රන්දෙනිගල ජලාශයක් ඒ ආශ්‍රිතව ඇති වන සංරක්ෂිතය සහ වනජීවී ඒකකයන් වලපනේ ප්‍රදේශයේ ඇති සුන්දර ස්ථාන අතර සුවිශේෂී ස්ථානයක් ගනී. ජලාශයේ දිය නෑම, බෝට්ටු පැදීම, මසුන් ඇල්ලීම ආදී කටයුතුත් වන සංරක්ෂිතයේ පක්ෂීන් ගවේශණාය කිරීමත්, වල් අලි නැරඹීමත් කළ හැකි සමහර ක්‍රියාකාරකම් අතරට වැටේ.

මෙම ස්ථානය පසුකර බදුල්ල දෙසට ගමන් කිරීමේදී දුන්හිඳ දිය ඇල්ලට පිවිසෙන ස්ථානයකට ලඟා විය හැකි අතර එතැන් සිට කිලෝ මීටර දෙකක පමණ දුරක් කැලෑව ඇතුලට පියමන් කරන ඔබට දිය ඇල්ලට ළඟාවිය හැකිය. මේ මාර්ගයේ තැනින් තැන කුඩාවට තැනුනු ගිමන් නිවන ස්ථාන ඇති අතර එහි ඇති වෙළඳසල්වල ගෙදර හදපු සිංහල කෑම වර්ග පලතුරු ජාති සහ නොයෙක් වර්ගයේ බීම ජාතීත් අලෙවි කෙරේ. මේ යන අඩිපාර වැටී ඇත්තේ විශාල ගස්වැල් වලින් වැසුණු වනාන්තරය මැදින් නිසා ගමන් විඩාව තදින් දැනීමට ඉඩකඩද අඩුය. මෙසේ ගොස් ලඟාවනදිය ඇල්ල ඉතාම මනස්කාන්ත එකක් වන බැවින් ඔබ සතුටින් උද්දාමයට පත් වනු ඇති.

මේ ස්ථානයට පිවිසෙන තැන සිට බදුල්ල නගරයට ඇත්තේ කිලෝමීටර 15ක පමණ දුරකි. බදුල්ලේ සිට ඇල්ලට පැය භාගයකින් පමණ ලඟවිය හැකි අතර බදුල්ල සිට බණ්ඩාරවෙලට යාමට ගතවන්නේ පැයකට අඩු කාලයකි. එතැන් සිට හපුතලේටද පහසුවෙන් ලඟාවිය හැකියි. වලපනේ, රන්දෙනිගල, බදුල්ල, වැලිමඩ, නුවරඑළිය හරහා නැවත වලපනේට ලඟාවීමටත් පුළුවන්.

වලපනේ සිට ලෝකප්‍රසිද්ධ ආරුගම්බේ ජල ක්‍රීඩා කරන ස්ථානයට යාමට ගත වන්නේ පැය තුනහමාරකි. මේ මාර්ගය මහියංගනය, බිබිල, මොණරාගල හරහා වැටී ඇති අතර බොහෝ සංචාරකයින් මේ මාර්ගයට වැඩි කැමැත්තක් දක්වන බව පෙනේ. මේ ප්‍රදේශවල ගමන් මාර්ගය හොඳින් සකසා ඇති බැවින් ඉක්මණින් හා පහසුවෙන් ගමනාන්තයට ලඟාවීමට හැකිය.

වලපනේ සිට නුවර එළියට යන මාර්ගය රාගල සහ කඳපොල හරහා වැටී ඇති අතර මේ යන ගමනේදී ඔබට තේ වතු, තේ කර්මාන්ත ශාලා, විශාල පරිමාණයේ එළවළු වගාවන් මෙන්ම ඈතින් දිස්වන කඳුවැටි ජලාශ සහ අනෙකුත් වෙ විවිධත්වයන් ද දැක ගත හැකිවේ. මේ මාර්ගය ද හොඳින් සකස් කර ඇති නිසා ගමනද පහසුයි.

මේ ලිපිය කියවන සිංහල ඔබට නුවරඑළිය ප්‍රදේශය ගැන ඉතා හොඳ දැනීමක් ඇතැයි මම සිතමි. එහෙත් වලපනේ සිට කඳු නැග කඳපොලට පිවිසෙන ඔබට ශිතල සුළඟ ඇඟ ගැටෙන බව එකවරටම දැනෙන්න පටන් ගන්නා බව මතක්කර දීමට කැමැත්තෙමි. මේ ශිතල ඇඟට පතට සුවදායක බව අප දනිමු. එහෙත් එය දවස මුළුල්ලේම විඳීමට අකමැති කෙනෙකුට පෙරළා ආපසු වලපනේට පැමිණ විශේෂයෙන් රාත්‍රී කාලය මෙහි ගත කිරීමට අවශ්‍ය සියලු පහසුකම් ඔස්ලින්ක් හොටෙල් ආයතනයේ ඇති බවට මතක් කර දීමට කැමැත්තෙමු.

කඳු නැගීම ඔබේ විනෝදාංශයක් නම්, වලපනේ ඔබේ අංක එකේ තේරීම කර ගන්න. ඔබට අවශ්‍ය ඕනෑම ආකාරයක කන්දක ඔබව කැඳවාගෙන යාමට පහසුකම් සැලසීමට අපට අවශ්‍ය වන්නේ කල් ඇතිව කෙරෙන ඉල්ලීමක් පමණායි. ඔබව මවිත කරන මනරම් දසුන් ගෙන එන කඳුවැටිවලින් වටවූ මේ ප්‍රදේශය කඳු නගින්නන්ගේ පාරාදීසයක් වන දිනය වැඩි ඈතක නොවේ යැයි මට සිතේ.

කඳු වලල්ලකින් වටවූ සදාහරිත නිම්නයක් වන වලපනේ ප්‍රදේශයට ඉතා ප්‍රසන්න කාලගුණයක් අවුරුද්ද මුළුල්ලේම පවතින අතර දහවල් කාලයේදී පරිසර උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 20 - 25 ක් දක්වා ඉහළ යන අතර රාත්‍රී කාලයේදී එය අංශක 15ක් දක්වා පමණ පහත වැටේ. මැසි මදුරු උවදුර හෝ අනෙකුත් කෘමී උවදුරන් ද මේ ප්‍රදේශයට ආවේණික වූ ලක්ෂණයක් නොවේ.



ඔස්ලින්ක් හෝටලය කාමර 35කින් සමන්විත වන අතර එයින් 30ක්ම වායුසමීකරණය කර තිබේ. මේ හැම කාමරයක්ම විශේෂ ගෘහනිර්මාණ ශිල්පයකට අනුව ඉහළම ප්‍රමිතියට නිමකර ඇත. එසේම ඒවා සියලු උපාංගවලින් සහ පහසුකම්වලින් ද යුක්තයි. කාමර ඉල්ලුම් කිරීමේදී ඔබගේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි ඔබගේ කාමරය වෙන් කරවා ගත යුතුයි.

උඩුමහල්වල ඇති කාමර ප්‍රමාණයෙන් විශාල උපරිම පහසුකම් සහිත ඒවා වන අතර වැඩි පරාසයක වටපිටාවක් දැකගත හැකිවන සේ සකස් වූ විශාල බැල්කනි වලින්ද යුක්ත වේ.

ඉහල මහල්වලටත්, වහලය මත ඇත උයනටත් එහි සිට තවත් ඉහලින් පිහිටා ඇති නැරඹුම් මැදිරියටත් ලඟවීමට පහසුවන සේ විදුලි සෝපානයක් සයිකර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමු. ගොඩනැගිල්ලේ ඉහලින්ම ඉදිකර ඇති නැරඹුම් මැදිරිය අංශක 360 ක වටපිටාවක් කිසිම අවහිරයකින් හෝ බාධාවකින් තොරව දැක බලාගැනීමට හැකිවන සේ නිමවා ඇති අතර උදෑසන හිරු උදාව බැලීමටත්, වලපනේ ප්‍රදේශය වටකරගෙන ඇති කඳුවැටි හොඳින් දැකබලාගැනීමටත්, වලපනේ නගරය සහ එහි වටපිටාව හොඳින් දැකබලා ගැනීමටත් දවසේ හිරු බැසයාම දැකීමටත්, රාත්‍රී කාලයේ ඇති අලංකාරය සහ නිහැඬියාව අත් විඳීමටත් මේ නැරඹුම් මැදිරිය තරම් අපූරුවූ තවත් තැනක් වලපනේ ඇතැයි මා නොසිතමි.

ඔස්ලින් හොටෙල් උත්සව ශාලාව අමුත්තන් 300කට වැඩි පිරිසකට එකවර පහසුවෙන් අසුන්ගත හැකි වන සේ ඉතාම විශාලට මෙන්ම අලංකාරයට නිමකර ඇත. ප්‍රමිතිය අතින් ඉහලම තත්වයේ ඇති මේ සුපිරි උත්සව ශාලාවද නිමකර ඇත්තේ සුවිශේෂී වූ ගෘහ නිර්මාණ ශිල්පයකට අනුවයි. මෙහි විශාල සෙනඟකට අවශ්‍ය සියලු පහසුකම් අඩුපාඩුවකින් තොරව සපයා තිබේ.

මේ ආයතනයේ ඇති අනෙකුත් පහසුකම් අතර පිලිගැනීමේ කවුන්ටරය සහ තාවකාලිකව රැඳී සිටීමේ ශාලාව (ලොබි එක), නේවාසික අමුත්තන් සඳහා වූ හෝජනාගාරය පොදුවේ පාවිච්චි කෙරෙන දෙවන භෝජනාගාරය, අවන්හල, ජිම් එක, බේකරිය සහ නේවාසික අමුත්තන් සඳහා වන ලොන්ඩරි පහසුකම් දැක්විය හැකියි. එසේම එසේම රියදුරු මහතුන් සඳහා වෙන්කෙරුණු කාමරද ආයතනය සතුයි. මේ සමහරක් පහසුකම් කල් ඇතිව වෙන් කරවා ගත යුතුයි. මේ බැවින් කාමර ඉල්ලා සිටින අවස්ථාවලදීම සඳහන් කර සිටීම අවශ්‍යතාවයක් වේ.

මෙහි පැමිණෙන ඔබට, සිංහල ක්‍රමයට හදපු කෑම බීම දවස පුරාම රස විඳීමට පුළුවන් අතර බේකරි නිශ්පාදනද එලෙසින්ම උණු උණුවේ රස බැලීමටත් පුළුවන්. සංචාරක ඔබ වෙනුවෙන් ඔබගේ අවශ්‍යතාවයට සරිලන සේ විශේෂ ආහාර පාන සකස් කර දීමට අපේ ප්‍රධාන අරක්කැමියා සූදානමින් සිටින අතර ඔබ කළ යුත්තේ කල් ඇතිව ඔබේ අවශ්‍යතාවය දන්වා සිටීම පමණායි. කන්ද උඩ පවත්වාගෙන යන, ඔස්ලින්ක් හෝටලයට ඇයිති එළවළු කොටුවලින් නෙලාගෙන එන නැවුම් එළවළු උයා පිහා ඔබට පිළිගැන්වෙන අතර මෙහිදී ඔබ අනුභව කරන සමහර පළතුරු ද නැවුම් ලෙස ඔබට ලැබෙන්නේ මේ කොටු වලිනුයි. මේ වතුවල ඇති කිතුල් ගස්වලින් පැණි හකුරුත් ගවයින්ගෙන් ලැබෙන කිරිත් ඔබට රසවිඳීමට හැකි බව දන්වනු කැමැත්තෙමු.

මේ කන්ද උඩ ඇති බංගලාවේ නතර වීමට කැමති සංචාරකයින්ට ඒ පහසුකමද සපයා ඇති අතර භාහිර ලෝකයෙන් සම්පූර්ණයෙන්ම වෙන්වී දින කීපයක් හෝ ඊටත් වැඩි කාලයක් ගතකිරීමට හිතන කෙනෙකුට කදිම තැනක් වන මෙතන කල් ඇතිව ඒ වෙනුවෙන් වෙන්කරවා ගත හැකියි.

මේ කී බොහෝ දෑත්, කඳුරට ඇති තව නොකියවූ බොහෝ දේත් දැකබලා ගැනීමට සහ ඒ සුන්දරත්වය අත් විඳීමට කැමති ඔබට ඔස්ලින්ක් හෝටලය වෙත පැමිණෙන ලෙස එහි අධිපතිතුමා සහ කාර්ය මණ්ඩලය ඔබට ගෞරවයෙන් ආරාධනා කර සිටී. මේ ආකර්ෂණීය වටපිටාවන්, තමන්ගේ දෙයක් සේ පරිහරණය කළ හැකි පහසුකම් පෙලක් ඔබේ නිවාඩුව කුල්මත්ව ගතකිරීමට මග සලසනු ඇත.

අංග සම්පූර්ණ සංචාරක හෝටලයක් වලපනේ ගොඩ නැගුණු පළමු අවස්ථාව මෙයවන අතර මේ දැවැන්ත ආයතනය වලපනේ ජනතාවට දායාද කළ වෛද්‍ය අජන්ත සෙනෙවිරත්න මහතාට සහ එතුමාගේ පවුලේ සැමට අතිශය කෘතඥ වන බව පවසා සිටින්නේ ප්‍රදේශවාසීන්, ආගමික නායකයින්, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ප්‍රධානීන්, ප්‍රදේශය නියෝජනය කරන දේශපාලඥයින් මෙන්ම ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින් ඇතුළු සියලු දෙනාය.

For more information and bookings please see the “book now” section of our website: www.Auslinkhotel.com
Facebook page: Auslink hotel
E-mail us on:
auslinkhotel@gmail.com
You may ring the hotel directly on
0094 52 2279403
Hotel fax number is 0094 52 2279402


## රියැදුරන් අවශ්‍යයි

UBER වාහන පැදවීම සඳහා පළපුරුදු රියැදුරන් අවශ්‍යයි නිකැළැල් රියැදුරු ඉතිහාසයක් ඇති අය විමසන්න. ටැක්සි බලපත්‍රය තිබීම අමතර සුදුසුකමකි

**විමසන්න 0422 671 826**

DOCUMENT TRANSLATIONS WITHIN A DAY
SWORN TRANSLATIONS ● NAATI TRANSLATIONS
ඕනෑම භාෂාවකට අයත් ලේඛණයක්
සීඝ්‍රගාමී පරිවර්තනය සඳහා
අප අමතන්න
03 9792 9977
සඳුදා සිට සිකුරදා දක්වා
පෙ.ව 9.00 - ප.ව 5.00 දක්වා විවෘතයි.
1/44 King Street Dandenong VIC 3175
WARNALEGAL
Justice for all
03 9701 3718 info@warnalegal.com warnalegal1